# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 27 දරන
## බෙදුම් නඩු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 මැයි මස 13 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 මැයි මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 18.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2024 අංක 27 දරන
## බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2024 මැයි මස 13 වන දින]

එල්.ඩී.-ඕ. 68/2021

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක 27 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන පනතේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) එම දැන්වීමේ පිටපතක් සහ එහි පරිවර්තනයේ පිටපතක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ තැපෑලෙන් යම් ග්‍රාම නිලධාරිවරයකු වෙත යවනු ලැබුවේ ද, ඒ සෑම ග්‍රාම නිලධාරිවරයකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල උපලේඛනය ද ඇතුළුව දැන්වීමේ ඇතුළත් කාරණා බැනරයක දක්වමින්, ඔහුගේ කාර්යාලයේ හෝ කාර්යාලය අසල, ප්‍රකට ස්ථානයක, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරයකට, දින තිහකට නොඅඩු කාලසීමාවක් ප්‍රදර්ශනය කර තැබීමට සැලැස්විය යුතු අතර, එසේ ප්‍රදර්ශනය කළ බවට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ග්‍රාම නිලධාරිවරයා වෙත එවන ලද දැන්වීමේ ඇතුළත් කාරණා, ග්‍රාම නිලධාරිවරයා විසින්,

අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල උපලේඛනය ද ඇතුළුව,-

(අ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරවලට, අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල ප්‍රකට ස්ථානයක බැනරයක ප්‍රදර්ශනය කිරීමට; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, එකී ඉඩමේ හෝ එකී එක් එක් ඉඩමේ සහ එකී ඉඩම හෝ එකී එක් එක් ඉඩමට නුදුරු යම් පොදු ස්ථානයක, ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක් මාර්ගයෙන් වාචිකව ප්‍රකාශ කිරීමට,

සැලැස්විය යුතු අතර, එසේ සිදු කළ බවට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ සිදු කරන ලද පළ කිරීමේ වියදම, පළමුකොට පැමිණිලිකරු විසින් දැරිය යුතු අතර, එය ප්‍රමාණානුකූලව අය කර ගත යුතු ය. ග්‍රාම නිලධාරිවරයා විසින්, මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් කර ඇති පළ කිරීම් ක්‍රියාත්මක කිරීම තහවුරු කරමින් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්, මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල දක්වා ඇති වාර්තා සමඟ එකී දැන්වීම ලැබුණු දින සිට මාස දෙකක් ඇතුළත අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මිනින්දෝරුවරයකු වෙත නිකුත් කරනු ලබන අධිකාර පත්‍රය දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එයට පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥවරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද පැමිණිල්ලේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී මිනින්දෝරුවරයා විසින් සකස් කරන ලද පිඹුර 18 වන වගන්තිය යටතේ අධිකරණය වෙත යැවීමෙන් පසුව, අධිකරණය විසින්-

(i) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයකු වෙත හෝ 73 වන වගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයන්ගේ ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය යටතේ මනින ලද ඉඩමක යම් විශාල හෝ කුඩා බිම් කොටසක් මැනීමට; හෝ

(ii) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයා හැර 73 වන වගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයන්ගේ ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය යටතේ මනින ලද ඉඩම නැවත මැනීමට,

බලය ලබා දෙමින්, අධිකරණයේ මෙහෙයවීම මත හෝ නඩුවේ යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම මත වැඩිදුරටත් වූ අධිකාර පත්‍රයක් නිකුත් කිරීමට නියම කළ හැකි අතර, අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී සකසන ලද පිඹුර මත වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය යටතේ සකසන ලද පිඹුර අධිස්ථාපනය කිරීමට හෝ නඩුව විමසීම සඳහා

අත්‍යවශ්‍ය වෙනත් යම් සමාන කාරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා, වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය ක්‍රියාත්මක කරනු ලබන මිනින්දෝරුවරයාහට නියම කරනු ලැබිය හැකි ය.

(ඇ) (ආ) වන ඡේදයේ සඳහන් කර ඇති වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී, ඒ සම්බන්ධයෙන් මේ උපවගන්තියේ (අ) වන ඡේදයේ විධිවිධාන, මේ වගන්තියේ (1), (3), (4), (5) සහ (6) වන උපවගන්තිවල විධිවිධාන සහ 17 වන සහ 18 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "අණබෙර ගසා," යන වචන වෙනුවට "ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක මාර්ගයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ (iv) වන උපඡේදයේ "මැනීමේ දී පැමිණ සිටි පාර්ශ්වකරුවෝ කවරහු ද යන වග" යන වචන වෙනුවට "මැනීමේ දී පැමිණ සිටි නඩුවේ පාර්ශ්වකරුවෝ කවරහු ද යන වග, ඔවුන්ගේ හිමිකම් පෑමේ ස්වභාවය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "බෙදුම් නඩුවක සෑම පාර්ශ්වකරුවකු ම විසින්" යන වචනවල සිට "සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අවකාශ නැත." යන වචන තෙක් ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"බෙදුම් නඩුවක සෑම පාර්ශ්වකරුවකු ම විසින්, ඒ ඉඩමෙහි තමාට ඇති අයිතිය, ඒ ඉඩමෙන් තමාට අයිති කොටස හෝ ඒ ඉඩමට ඇති තම සම්බන්ධතාව ඔප්පු කිරීමට තමා උපයෝගි කොට ගන්නා ලේඛනවල ලැයිස්තුවක්, ඒ ලේඛනවල ඇතුළත් කරුණුවල සංක්ෂිප්තයක් ද සමඟ සහ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක්, ඒ නඩුව විභාග කිරීමට නියමිත පළමු දිනයට දින තිහකට නොඅඩු කාලයකට පෙර, අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

නඩුව විභාග කිරීමට නියමිත පළමු දිනයට පසුව මැදිහත් වීමට යම් පාර්ශ්වයකට අවසර දී ඇති අවස්ථාවක, එම පාර්ශ්වය විසින් එකී මැදිහත් වීමේ සිට දින තිහක් ඇතුළත ලේඛනවල ලැයිස්තුවක් සහ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය. ඉදිරිපත් කිරීමට අදහස් කරන යම් ලේඛනයක් හෝ සාක්ෂිකරුවකු ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කළ ලැයිස්තුවල ලැයිස්තුගත කර නොමැති නම්, කිසිඳු පාර්ශ්වකරුවකුට, අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් නියම මත අධිකරණය විසින් අවසර දුනහොත් මිස, ඒ නඩුවේ දී තමා වෙනුවෙන් එම ලේඛනය හෝ සාක්ෂිකරුවා සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අවසර නොමැත්තේ ය.”.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 24අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය. *ප්‍රධාන ප්‍රඥප්තියට 24අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම*

“උත්තරවාද සංශෝධනය කිරීම

24අ. (1) නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයට ප්‍රථම අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත නඩුවේ සියලුම පාර්ශ්වකරුවන් පැමිණ සිටිය දී හෝ නඩුවේ සියලුම පාර්ශ්වකරුවන්ට සාධාරණ කාලයක දැනුම්දීමකින් පසු නඩුවේ සියලු උත්තරවාද, ඒවාට යමක් එකතු කිරීමෙන් හෝ ඒවා වෙනස් කිරීමෙන් හෝ ඒවායේ යමක් අත්හැරීමෙන් හෝ ස්වකීය අභිමතය පරිදි සංශෝධනය කිරීමට, අධිකරණයට සම්පූර්ණ බලය ඇත්තේ ය.

(2) නඩු ගාස්තුවලට යටත්ව හෝ අන්‍යාකාරයෙන් යම් උත්තරවාදයක් සංශෝධනය කිරීම සඳහා අවසර නොදුනහොත් බරපතළ වූ ද ප්‍රතිකර්ම යෙදිය නොහැකි වූ ද අයුක්තියක් සිදුවන බවට හෝ අයිතිවාසිකම සම්බන්ධයෙන් සම්පූර්ණ විමර්ශනයක් කිරීම වළක්වන බවට සහ එසේ ඉල්ලුම් කරනු ලබන පාර්ශ්වකරු අනවශ්‍ය ප්‍රමාදය පිළිබඳ වරදට වරදකරු වී නොමැති බවට වාර්තා කළ යුතු හේතු සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට

පත් වන්නේ නම් මිස, නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයේ දී හෝ ඉන්පසුව උත්තරවාද සංශෝධනය කිරීම සඳහා වන කිසිදු ඉල්ලීමකට අවසර ලබා නොදිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් අවසර දෙනු ලැබිය හැකි උත්තරවාද සංශෝධනය සඳහා වන යම් ඉල්ලීමක්, සුදුසු යයි අධිකරණය අදහස් කරනු ලබන පරිදි, නඩු ගාස්තු සහ නඩුව කල් තැබීම හෝ අන්‍යාකාරයෙන් සිදු කිරීම පිළිබඳව යම් නියම මත විය යුතු ය.

(4) උත්තරවාදවල කරන එකතු කිරීම් හෝ වෙනස් කිරීම් හෝ අත්හැරීම්, ආඥාව බලපාන්නා වූ උත්තරවාදය මත පැහැදිලිව කරනු ලැබිය යුතු ය; නැතහොත් එය පහසුවෙන් කරනු ලැබිය නොහැකි නම්, වෙනස් කරන ලද පරිදි වූ උත්තරවාදයේ පැහැදිලි පිටපතක් නඩුවේ වාර්තාවෙහි සංශෝධනය කරන උත්තරවාදයට අමුණනු ලැබිය යුතු ය. ඒ සෑම එකතු කිරීමක් ම හෝ වෙනස් කිරීමක් ම හෝ අත්හැරීමක් ම විනිශ්චයකාරවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(3) ඉඩම හෝ එහි යම් කොටසක් බෙදා වෙන් කළ යුතු යයි අධිකරණය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ අධිකාර පත්‍රය 73 වන වගන්තියේ සඳහන් කරන ලද ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති යම් වෙනත් මිනින්දෝරුවරයකු වෙත හෝ 73 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන අවස්ථාවක, 26 වන වගන්තිය යටතේ මුල් තීන්දු ප්‍රකාශය වාර්තාගත කිරීම මගින් යම් අයිතියක් ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් පාර්ශ්වකරුවන් වෙත ද, එම සියලු ම

පාර්ශ්වකරුවන්ගේ එකඟතාවය මත වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත හෝ නිකුත් කිරීමට අධිකරණය විසින් තීරණය කළහොත් මිස, ඒ අධිකාර පත්‍රය 17 වන වගන්තිය යටතේ මුල් මිනුම කළ මිනින්දෝරුවරයා වෙත නිකුත් කළ යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "අණබෙර ගස්සවා" යන වචන වෙනුවට "ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක මාර්ගයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම

36අ. 36 වන වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 754 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ "36අ සහ 45අ වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "36 වන සහ 45 වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ වෙනුවෙන් මෝසමක් මගින්" යන වචන වෙනුවට "ඒ අවසාන තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට හෝ අභියාචනයක් කරනු ලැබුවේ නම්, එම අවසාන තීන්දු ප්‍රකාශය ස්ථිර කරන ලද අභියාචනය පිළිබඳ අවසාන තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට අවුරුදු දහයක් ඇතුළත ඒ වෙනුවෙන් මෝසමක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) 15 වන වගන්තිය යටතේ බැනරය ප්‍රදර්ශනය කිරීමේ දී සහ ප්‍රකාශනයේ දී දරන ලද ගාස්තු සහ 17 වන වගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශනයේ දී දරන ලද ගාස්තු;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "අලාභ හානියක් සිදු වීම" යන වචන වෙනුවට "අලාභ හානියක් සිදු වීම හෝ ඉඩමේ ස්වභාවයට යම් වෙනසක් සිදු කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියමිත "ග්‍රාම නිලධරයාගේ වාර්තාව" යන ශීර්ෂයෙන් යුත් ආකෘතියː-

(අ) "(15 (2) වන වගන්තිය)" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(15 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) " මීට යා කොට ඇති දැන්වීම් (පරිවර්තන සමඟ) 19........ දින සිට 19...... දින දක්වා මාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ බව අධිකරණය වෙත මෙයින් වාර්තා කරමි." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත වචන ආදේශ කිරීමෙන්-

"ඉඩමේ උපලේඛනය ද ඇතුළුව දැන්වීමේ ඇතුළත් කරුණු දක්වන ලද බැනරයක් ........ දින සිට ......... දින දක්වා මාගේ කාර්යාලයේ ප්‍රකට ස්ථානයක සහ ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ බව සහ එකී ඉඩමේ සහ එකී ඉඩමට නුදුරු පොදු ස්ථානයක ශබ්ද විකාශන

යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක් මාර්ගයෙන් වාචිකව ප්‍රකාශ කළ බව අධිකරණය වෙත මෙයින් වාර්තා කරමි."; සහ

(2) එහි 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමිත "මිනින්දෝරුවරයාගේ වාර්තාවේ ආකෘතිය" යන ශීර්ෂයෙන් යුත් ආකෘතියේ (vi) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(vi) පැමිණ සිටින පාර්ශ්වකරුවෝ සහ ඔවුන්ගේ හිමිකම් පෑමේ ස්වභාවය;".

**16.** සැක දුරු කිරීම සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට මේ පනතේ 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ගොනු කරනු ලැබ අවසන් නොවූ යම් නඩුවකට, නඩු කටයුත්තකට හෝ අභියාචනයකට අදාළ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සැක දුරු කිරීම

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.